8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# පහතරට ශාන්තිකර්මවල අවස්ථෝචිත රස උද්දීපනයෙහි ලා භාවිත නාද නිෂ්පත්ති විධික්‍රම

සම්පත් එන්.ජී.සී.

පහතරට නර්තන අධ්‍යයනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
chanaka.ngcs0531@gmail.com

**සාරසංක්ෂේපය**
පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම විවිධ අභිලාෂයන් මූලික කොට ගෙන පවත්වනු ලබයි. ප්‍රේක්ෂකයාට මානසික සුවය හා විවිධත්වයකින් යුත් රස උද්දීපනයට අවස්ථෝචිත ව නාද උපයෝගී කොට ගනී. එහි දී ශාන්තිකර්ම ශිල්පීන් භාවිත කළ විධික්‍රම අධ්‍යයනය හා එහි වර්තමාන භාවිතය පිළිබඳ පර්යේෂණය කිරීම මෙමගින් අරමුණු වේ. කටහඬ, බෙරහඬ, ගෙජ්ජි, සිලම්බු, වළලු, වස්දණ්ඩ ආදී නාද ගණනාවක් අවස්ථෝචිත ව එකිනෙකට වෙනස් අයුරින් ශාන්තිකර්ම තුළ භාවිත කරනුයේ ඇයි ද? යන ගැටලුව පිළිබඳ මෙහි දී අධ්‍යයනය කෙරේ. එසේ අධ්‍යයනය කිරීම මගින් පහතරට ශාන්තිකර්ම තුළ අන්තර්ගත විවිධ නාද, ප්‍රේක්ෂක මනස උද්දීපනය සඳහා ඉවහල් වන බවත්, ශාන්තිකර්මය පවත්වන කාලය තුළ ප්‍රේක්ෂකයා ග්‍රහණය කර ගැනීමට හැකි බව පැහැදිලි විය. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා හා සහභාගීත්ව නිරීක්ෂණ මගින් ඒ සඳහා අවශ්‍ය දත්ත රැස්කරගන්නා ලදි. එමගින් ක්‍රමවත් ව, පදනමක් සහිත ව මෙකී නාද සංයෝජනය ශාන්තිකර්ම තුළ ගොඩනැගී ඇති බව වඩාත් තහවුරු විය. පර්යේෂණය සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් සකස් කොට තත් විෂය ක්ෂේත්‍රයෙහි නියැළෙන පාරම්පරික ශිල්පීන්, ශබ්ද පරිපාලන ශිල්පීන් හා මානසික වෛද්‍යවරුන් සමග සාකච්ඡා පවත්වා ඊට අදාළ දත්ත රැස්කර ගන්නා ලදි. එම දත්ත විශ්ලේෂණය මගින් ශාන්තිකර්මවල නාද භාවිතය ක්‍රමවත් ව ගොඩනැගීමෙන් පුද්ගල මනසෙහි රස උද්දීපනයට අවස්ථෝචිත ව අයුරින් යොදා ගෙන ඇති බව නිගමනය විය. නාද තුළ පවතින විස්තාරයේ ප්‍රබලතාව මත සංඛ්‍යාතය වෙනස් වේ. ඒ අනුව ශාන්තිකර්මයන්හි භාවිත විවිධ නාදවල සංඛ්‍යාතයන් තාක්ෂණික ක්‍රම ඔස්සේ එහි තීව්‍රතාව ගණනය කොට මෙම පර්යේෂණය වඩාත් තහවුරු කිරීමට හැකි විය. එමගින් ශාන්තිකර්මයෙහි නාදවල තරංග ශක්තිය මගින් ප්‍රේක්ෂකයාට මානසික ව සිදු කරන බලපෑම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. තව ද වර්තමානයේ දී ශාන්තිකර්මයන්හි එකී නාදය තුළින් රස උද්දීපනය කිරීමේ ක්‍රමවේදයෙන් බැහැර ව ඇතැම් අවස්ථාවල ශාන්තිකර්ම ශිල්පීන් කටයුතු කරන බව හඳුනාගත හැකි වූ අතර ඊට හේතුව එම නාද භාවිතයේ නිවැරදි අවබෝධයක් නොමැති නිසා බව නිගමනය විය. මෙම පර්යේෂණය මගින් ශාන්තිකර්ම තුළ තිබෙන නාද විධික්‍රම හඳුනාගැනීම, ඒ පිළිබඳ තත් විෂය ක්ෂේත්‍රයේ නියැළෙන ශිල්පීන්ට අවබෝධයක් ලබා දීම හා ශාන්තිකර්මයන්හි අන්තර්ගත ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ වර්තමාන අවශ්‍යතාවක් බව ද නිගමනය විය. ඒ පිළිබඳ ශාන්තිකර්ම ශිල්පීන්ගේ අවධානය යොමු කරවීමේ අවශ්‍යතාවක් ඇති බවත් එය ශාන්තිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හේතු වන බවත් මෙහි දී වඩාත් ප්‍රත්‍යක්ෂ විය.

**ප්‍රමුඛ පදඃ** *පහතරට ශාන්තිකර්ම, අවස්ථෝචිත, රස උද්දීපනය, නාද විධික්‍රම, ප්‍රේක්ෂකයා*